අධ්‍යාපන අමාත්‍යාංශය **21 S I II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

පැය තුන යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුය:

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් **සමීප අර්ථය** දෙන උත්තරය තෝරන්න.

1. පියාගේ වියෝවෙන් පසුව අම්මා දරුවන් හදා වඩා ගැනීමට **ඉර හඳ හා සටන්** වැදුණා ය.

(1) අත පය වෙහෙසා වැඩ කළා ය. (2) ඉර හඳ දෙස බලා වැඩ කළා ය.
(3) දිවා රෑ නොබලා වැඩ කළා ය. (4) ඉර හඳ හා ගැටෙමින් වැඩ කළා ය.

2. රිය අනතුර ඇසින් දුටු ගැමියා ඒ පිළිබඳව **ඉස්පිල්ලක් පාපිල්ලක් නැර** තොරතුරු පැවසුවේ ය.

(1) කිසිවක් අත් නොහැර (2) ඉස්පිලි පාපිලි අත් නොහැර
(3) සියලු තොරතුරු සාරාංශ කොට (4) සියල්ල රහ පා දක්වමින්

3. පාලම සෑදීමේ ව්‍යාපෘතිය **සුදු අලියෙකු** බවට පත්ව ඇති බව ගම්මුන්ගේ අදහස විය.

(1) සුදු අලියෙකු යොදා ගෙන කළ කටයුත්තක්
(2) විශාල මුදලක් වැය කළ යහපත් කටයුත්තක්
(3) ඉතා ඉහළ වියදම් ගිය කාර්යයක්
(4) වියදමේ තරමට ප්‍රයෝජන නොලැබෙන දෙයක්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. කවියෙකුගේ ..... කාර්යයක් වන්නේ සහෘදයාගේ රස වින්දන නිම් වළලු පුළුල් කිරීම යි.

(1) ප්‍රතිභාපූර්ණ (2) බුද්ධිගෝචර
(3) දෘශ්‍යගෝචර (4) භාවපූර්ණ

5. ව්‍යුත්පත්තිය යනු ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන ..... හා පීවන තත්සලාවෙන් ලබන අත්දැකීම් සමුදාය යි.

(1) බහුපයිතතාව (2) පරිකල්පනය
(3) විශිෂ්ටත්වය (4) සතතාභ්‍යාසය

6. සිංහබාහු නාට්‍යය ගීතාත්මක හා කාව්‍යාත්මක ලක්ෂණයන්ගෙන් ..... වූ බස් වහරකින් හෙබි දෘශ්‍ය කාව්‍යයකි.

(1) සංකෝචනය (2) ආකර්ෂණය
(3) සංකලනය (4) චිත්‍රණය

[දෙවැනි පිටුව බලන්න.

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) නත්කාල, ත්‍රිපිටකය, තික්ෂ්ණ, තුදුස
(2) දිනදෙව්, දිනාන්ත, දියන්ත, දිවයුරු
(3) චතුර්ථ , චතුර්විද්‍යා, චතුර්වේද, චතුමධුර
(4) තෙළෙස් , තෙවළා, තේරුම්, තේක්ක

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කනගාටුව, පිළියෙල, කලණ, වාණිජ
(2) පඩි පෙළ, පෙලඹවීම, පැලකිලි, ඇහලුම්
(3) කළුරිය, බිළිඳා, වසුළ, ගණුදෙනු
(4) ලේඛන, උච්චාරණ, ස්ථරය, ත්‍යාග ප්‍රධානය

9. ගැට ඇලපිල්ල, රේඵය, රකාරාංශය, යංශය, පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.

(1) කෘතඥත්ත, ප්‍රත්‍යක්ෂ, සංග්‍රහය, ස්වඝය
(2) විග්‍රහය, ශාන්තිකම්, සත්‍යය, තෘණ වර්ග
(3) ත්‍යාගය, ප්‍රමාණය, සංස්කෘතිය, වර්ධනය
(4) නිකෘෂ්ට, කර්මය,චිත්‍රණය, විද්‍යාව

10. 'පොතපතින් නැණගුණ වැඩේ' යන වාක්‍යයෙහි 'පොතපතින් ' යන වචනය අයත් විභක්තිය කුමක් ද?

(1) ආධාර විභක්තිය
(2) අවධි විභක්තිය
(3) සම්බන්ධ විභක්තිය
(4) කරණ විභක්තිය

11. පහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියා පද අයත් වර්ගය අනුපිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.

"රජතුමා නිලමේවරුන් ලවා ශිල්පීන් කැඳවමින් අලී ඇතුන් ද සහභාගි කරවාගෙන උත්සවශ්‍රීයෙන් පෙරහැර කරවී ය. "

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
(2) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අවසාන ක්‍රියා

12. " නවීන " යන වචනය වාක්‍යකරණානුකූලව අයත් වන්නේ,

(1) විභක්ති පදවලට ය.
(2) කෘදන්ත පදවලට ය.
(3) විශේෂණ පදවලට ය.
(4) තද්ධිත පදවලට ය.

13. **නවීන ක්‍රමෝපාය මගින් අධ්‍යාපනයේ සාර්ථකත්වය වර්ධනය කළ හැකි වෙයි. මෙම වාක්‍යයේ තද කළු අකුරෙන් දැක්වෙන පදය අයත් වන්නේ,**

(1) ස්වරාදේශ සන්ධියට ය.
(2) ගාත්‍රාදේශ සන්ධියට ය.
(3) පූර්ව ස්වර ලෝප සන්ධියට ය.
(4) පරස්වර ලෝප සන්ධියට ය.

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල නද කළ අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.**

14. වර්තමාන සිංහල සාහිත්‍යයෙහි කැපී පෙනෙන සාහිත්‍යාංගයක් වන ගීත සාහිත්‍යය විවිධ සංස්කෘතීන් ඇසුරෙන් **පරිපෝෂිත** වූවකි.

(1) අන් අයගෙන් පෝෂණය වූ
(2) පෝෂණයට ලක් නොවූ
(3) මනාව පෝෂණය වූ
(4) ප්‍රතිවාදීන්ගෙන් පෝෂණය වූ

15. කාර්මික ප්‍රජාවගේ **ශිල්පීය** ප්‍රාගුණ්‍යය රටේ ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියට හේතු වන්නේ ය.
(1) දායකත්වය
(2) නිපුණත්වය
(3) සාමර්ථ්‍යය
(4) ප්‍රබලත්වය

16. ඇතැම් ලේඛකයෝ සම්ප්‍රදාය අතික්‍රමණයෙන් නව මං සොයා යෑමට උත්සුක වෙති.

(1) අනුක්‍රමයෙන්
(2) අනුකරණයෙන්
(3) විනාශ කිරීමෙන්
(4) ඉක්මවා යෑමෙන්

17. මූලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - දියණියෝ , කාලීන, නෛතික, ධීමත්
(2) නිපාත - පාසා, මිස, තුරු, එව්
(3) උපසර්ග - කු, පිරි, අබි, සු
(4) කෘදන්ත - වැටී, කැපිලි, වැයුම්, ගයන්නී

18. සිංහල භාෂාවේ විභක්ති ප්‍රත්‍යය නොගන්නා පද විශේෂයක් වන්නේ,

(1) අව්‍යය පදයි
(2) කෘදන්ත පදයි
(3) තද්ධිත පදයි
(4) සමාස පදයි

19. එක් එක් පද පේළියේ පමණාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ප්‍රාචීන - පෙර දිග, ආපත්ති - ආපදා, ගම්භීර - ගැඹුරු, කලඥ - පරෙවියා
(2) අකුප්ප - හෙණ්ඩුව, විලිකුන් - ලජ්ජාශීලී, සියත්බවින් - ස්වීයත්වයෙන්, නැණසර - ප්‍රාඥයා
(3) අධිවාසනා - ඉවසීම, කුත් යළක් - කුත් වනාවක්, වරණ්ඩු - පිහරජු, ඉදුහ බලය - සෘද්ධි බලය
(4) ආජ්ඣ - වැඩිහිටි, පරිශීලනය - හැදෑරීම, බ්‍රහ්ම බල - බාහු බලය, හඵයේ - මුදාහැරියේ

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ මෙයින් කුමක් ද?

(1) උත්පන්න - ප්‍රහීණ
(2) ස්නිග්ධ - සුනිශ්චිත
(3) කුටිල - ඍජු
(4) අන්වර්ථ - ආරූ

21. සරස්වතී අභිනන්දන ගීතය ගායනයෙන් කලා උලෙළෙහි සමාරම්භය සිදු විය. මේ වැකියේ අභිනන්දන යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් යෝග්‍ය පදය කුමක් ද?

(1) අභිවාදන
(2) පිළිගැනීමේ
(3) අනුස්මරණ
(4) ගුණ ගායන

[හතරවැනි පිටුව බලන්න.

22. උක්ත පද සමූහයක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) තොප, ගැහැනිය, ඔවුහු, කිසිවෙක්
(2) මා, පාපල, දියණියන්, පියෙක්
(3) ගුරුවරයෙක්, රීතීහු, කවුරු, ළමයි
(4) කුරුල්ලෝ, වඩුවන්, ගුටුව, දැරියක්

23. වැරදී අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) උඩරට ජන වහරෙහි 'ඇම්බරයා' යනු පොදු වහරේ මගුල් කපුවා යන අරුත දෙයි.
(2) සමඟ, කැටුව, එක්ව යන නිපාත හා බැඳෙන නාම පදය අනුක්ත රූපයෙන් කැබෙයි.
(3) ව්‍යඤ්ජනයකට පරව බැඳෙන 'ර්' වෙනුවට රකාරාංශය යෙදේ.
(4) නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යය ගැන්වූ විට විවිධ විභක්ති අර්ථ ගැනේ.

24. විභක්ති සමාසයට උදාහරණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) කම්කරු
(2) පදවත
(3) පරාපද
(4) මුහුදුසුළං

25. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන චිත්‍රපට නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) මරපතුපදල්
(2) පෙගරම්පාළිද
(3) ල්හණිනලාකොා
(4) රඳන්කඟප

• අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. කෙනෙකු මුළා කොට තමාගේ කටයුත්ත කර ගැනීම

(1) දියකාවාගේ පිටේ ලුණු භාංගුවා වාගේ
(2) තරියාට කුකුළු කොටුව භාර දුන්නා වගේ
(3) පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ
(4) කිඹුලාට මඟුල් ඡෝඩු කළා වගේ

27. පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සංග්‍රහ කිරීම

(1) කලකදී වහලු කලකදී රස චෙනවා ලු
(2) කත්න ගිතුණා ම කබරගොයන් තලගොයා චෙනවා ලු
(3) එපා වාහෙට හොදි බෙදන්නා වාගේ
(4) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වාගේ

28. A - උපසර්ග යනු නාමයකට පරව යෙදෙන ප්‍රත්‍යය විශේෂයකි.
B - ර අකුරෙන් පරව යංශය නොයෙදේ.
C - ආකස්මිකව - හේතුවක් නැති යන්න අදහස් වේ.
D - සා - ප්‍රමාණාර්ථයෙහි නිපාත වේ.

A,B,C,D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ.

(1) A,B, හා C ය.
(2) B,C හා D ය.
(3) A,C හා D ය.
(4) A,B හා D ය.

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ඇතුළත් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) ඕ තොමෝ සතුටින් ගී ගයමින් රසිකයන් පිනවති.
(2) රන් පැහැ තාරකාවෝ නුබගැබ සරසන්නී ය.
(3) සියලු දරුවෝ දෙස බස රස කෙරෙහි ඇලුම් කළ යුත්තෝ ය.
(4) කම්කරුවන් විසින් පාරවල් පිළිපකර කරනු ලබති.

30. (1) පදිකයන් පාරේ දකුණු පසින් ගමන් කිරීම යෙහෙකි.
(2) බල්ලන් බුරද්දී සොරුන් වහ වහා පලා ගියහ.
(3) මාර්ටින් වික්‍රමසිංහ පුවත්පත් කලාවේදියෙක් මෙන් ම ගත්කතුවරයෙක් ද විය.
(4) සියලු ම සාමාජිකයෝ හෙට රැස්වීමට සහභාගී වනු ඇත.

31. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනුපිළිවෙළ කුමක් ද?

(1) අප නගරයට ගියේ සන්දර්ශනය බලා සතුටු වීමට ය.
(2) මුවෙක් දඩයම්කරුවකු විසින් අටවන ලද උගුලක බැඳිණි.
(3) මගිය, ඔබ කොහි පිට එන්නේදැයි කියග.
(4) හෙට වැසි නොවැටුණොත් කම්කරුවන් ඒවි.

A - උක්ත කර්මය
B - අනුක්ත කර්තෘ
C - විධි ක්‍රියා
D - අනියමාර්ථයේ අපම්භාව්‍ය ක්‍රියා

A,B,C,D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ.

(1) A C B D (2) B A C D
(3) B C D A (4) C A D B

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ළමයි දෙන්නෙක් වැටිච්චි අඹ අහුලනවා එයා දැක්කා"

(1) ළමයින් දෙදෙනෙකු වැටුණු අඹ අහුලනු ඔහු දුටුවේ ය.
(2) ළමයි දෙදෙනෙක් වැටුණු අඹ අහුලනවා ඔහු දුටුවේ ය.
(3) ළමයි දෙදෙනෙකු වැටුණු අඹ අහුලනු ඔහු දුටුවේ ය.
(4) ළමයින් දෙදෙනෙක් වැටුණු අඹ අහුලනු ඔහු දුටුවේ ය.

33. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක් නොවන්නේ කුමක් ද?
(1) එලොව ගිහිං මෙලොව ආවා.
(2) වෙල්ල වැහුම්
(3) මනමේ
(4) දෝන කතිරිනා

34. රූපකයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මිදුලෙ පහන් පැලේ නිතර සැලුණු දැල්ල නිවී ගොස් ය.
(2) මේ මවගේ හදවත ඇතුළත බුර බුරා නඟින දුක් ගින්දර යි.
(3) සින්ධූපමාන වැව්තලා මතින් ඇදී පද්ම රේණුයෙන් සුගන්ධ වී
(4) එබසට ලැජ්ජාවෙන් ළද බැමිණී අබ සැට ලාසක් පුපුරන ලෙසිනී

[හයවැනි පිටුව බලන්න

35. "ඇත ධූලින් වැසී ගිය ඇත් රජ යැ, මැක සවණක් ගත රැසින් සැදී ගිය බුදුරජාණෙණ් යැ" යන පාඨය සවණක් යන වචනයේ අර්ථය කුමක්ද?

(1) සර්වඥ (2) ෂඩ්ක්ර්ණ
(3) ෂඩ්වර්ණ (4) ශ්‍යාමවර්ණ

36. පහත සඳහන් පද්‍ය යේ දෙවැනි පදය තෝරන්න.

මැනලා වී දෙකක් නොලැබී මල්ලකට
.....
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
ඇහුවා මගෙ පුතේ කිරි මිනැද උඹට

(1) දරුවොන් එක්ක මම වැටිලා ඉන්නකොට
(2) තත්නාදුනන මෙනුවර තනි වුණ අපට
(3) ඉන්නේ කවුද රැකවරණයට බැල්මකට
(4) යම්දෝ හෙට උදේ අපි ආපහු ගමට

37. බියෙන් නොහැර කරනා විලස අදකුරු
පුහුන් කරති සත මෙහි පසඟ ගොස කුරු

ඉහත සඳහන් පද්‍ය කොටස ඇතුළත් නව නිර්මාණයේ රචකයා වන්නේ,

(1) සයිමන් නවගත්තේගම
(2) හෙන්රි ජයසේන
(3) දයානන්ද ගුණවර්ධන
(4) ජයලත් මනෝරන්න

38. පහත දැක්වෙන කවියෙන් කියවෙන ජීවනෝපාය වන්නේ කුමක් ද ?

රුක් අත්තන පෙතෙන් පලු බෝ මී නහට
මක් මී දිවුල් කොළ බෝ දාඹු මී බට
මික් දඹ ලෝලු කොඹමු කරටි දෙමට
අන්වල අත අල්ලනු මරු මුවා කොට

(1) වී ගොවිතැන (2) මැටි කර්මාන්තය
(3) හේන් ගොවිතැන (4) පතල් කර්මාන්තය

39. පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

· නොවිනර තෙද බලැති මහතුන් හට පවර
වැරසර නොවන නුනුවණ දන බදිනු වෙර
කුඹුතර ගිරි පළන දළ දළඟින් පැහැර
මතවරණිදුට පෙදෙනැන වෙහෙසෙන අපුර

1. විශාල පර්වතයකට බලැති මහතුන් විසින් මතැනි ඇතුන් ලවා දළ අඟින් පහර දීමට උත්සාහ කිරීම නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීමට සමානය

2. අප්‍රමාණ තෙජස් ද බලය ද ඇත්තා වූ උතුම් මහතුන් හට විරසාර ගතියෙන් හා නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීම, විශාල පර්වතයන් දැඩි දළ අඟින් පහර දී පළා දමන, මත් ඇත් රජකුට පයින් ඇන වෙහෙස ගන්නාක් වැන්න.

3. අප්‍රමාණ තේජස් බලයෙන් යුක්ත මත් ඇත් රජකු විසින් විශාල පර්වතයකට දළ අඟින් පහර දීම නුවණින් අඩු මිනිසුන් උතුම් මහතුන්ට කරන වෛර බැඳීමක් වැන්න.

4. අප්‍රමාණ තේජස හා බලයෙන් යුක්ත උතුම් මිනිසුන්ට මෝඩ ජනයා වෛර බැඳීම, දළ අඟින් පහර දෙන මත් ඇතුන් වෙහෙසට පත් කරන්නාක් වැනි ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

"රස විඳීමයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රසවින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම වර්ධනය වේ."

(1) රසවින්දනය සඳහා භාෂාව අත්‍යවශ්‍ය නොවූව ද භාෂා වර්ධනයට රසවින්දනය අත්‍යවශ්‍යය
(2) භාෂාව රසවින්දනයට හේතුවන අතර භාෂාව දැන ගැනීමට රසවින්දනය ද අවශ්‍ය වේ
(3) භාෂාවේ ශක්‍යතාව වැටහෙන්නේ බස සූක්ෂ්ම ලෙස පරිහරණය කරන රසිකයන්ට ය.
(4) රස විඳීමය සඳහා භාෂාවත්, භාෂාවර්ධනය සඳහා රසවින්දනයක් ඉවහල් වේ.

**

අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යයන 21 S I, II

පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

සිංහල භාෂාව හා සාහිත්‍යය II

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

1. (i) සිව (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්
(අ) තාපික්‍ය (ආ) අන්තඃස්ථ
අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

ධාරාණිපාත වර්ෂාව නිසා උද්ගත වූ බරපතල ගැටලු හේතුවෙන් රටේ ආර්ථික වර්ධනයට බලපෑම් එල්ල විය.

(iii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග සහිත පද දෙකක් උපුටා දක්වන්න.

ඓතිහාසික කතා ප්‍රවෘත්තක් ආශ්‍රයෙන් නිමැවුණු ඕනෑම පටයට ඉමහත් ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් හිමි විය.

(iv) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන නනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) සියලු අතින් ම යහපත් වූ (ආ) එක අරමුණක පිහිටා ඇති බව

(v) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ග නම් කරන්න.

(අ) නැණින් ගුරුන් ලෙද රන් දිව හිනැඟේවා
(ආ) ළඳේ නිසරු නොකරන් අප පියලා

(vi) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩයෙහි ඇතුළත් තද්ධිත පද දෙකක් ලියන්න.
නරපතියාණෙක් මිණිමුවා කිරුළ හිස පැලඳ රාජසභාවට සම්ප්‍රාප්ත වූහ.

(vii) පහත දැක්වෙන පද විසන්ධි කොට ලියා ඒවා අයත් සන්ධි වර්ගය නම් කරන්න.
(අ) සුරිදු (ආ) වියවුල්

(viii) පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම්වලින් පළමුවන වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. එසේත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) වන්දු මවල (ආ) මවු ගෘහාව

[නවවැනි පිටුව බලන්න.

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ප්‍රේක්ෂකයෝ නාට්‍ය ශාලාවේ අසුන් ගෙන ඇත.
(ආ) ගුරුවරුන් පිසුන් කැටුව පොත් ප්‍රදර්ශනයට සහභාගී වූහ.

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා පනල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.

(අ) නොවටිනා ගල් (ආ) ගැරීමෙන් පසු පතුලේ ඉතිරි වන කොටස

(ලකුණු 2×10 = 20 යි)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඇ), (ඒ) යන විස්තර අනුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමාන තාක්ෂණ දියුණුවත් සමඟ කියවීමේ මාධ්‍ය සුළුල් වී ඇත. ජීවිතය වඩා සාර්ථක කර ගැනීමට කියවීමෙන් ලැබෙන පිටිවහල මිනිය නොහැකි තරම් ය. විවිධ හේතු නිසා කියවීමේ රුචිය සමාජයෙන් ඇත් වන බවට චෝදනා නැඟෙයි. කියවීම ප්‍රවර්ධනය උදෙසා කළ හැකි දේ කොතෙහෝ ය.

(ආ) හරිත පැහැය වියකෙමින්, වන සම්පත ක්ෂය වෙමින් යන ලොවක අපි වර්තමානයේ දිවි ගෙවමු. ඒ සඳහා පෘථුව ම බලපාන්නේ මිනිස් ක්‍රියාකාරකම් ය. එහි අනිටු විපාක හුක්ති විඳීමට සිදු වී ඇත්තේ ද මිනිසාට ය. මේ පිළිබඳ ලෝක මට්ටමේ අවධානය යොමු වී ඇති අතර මෙම අර්බුදයෙන් මිදීම සඳහා මානව ප්‍රජාව වශයෙන් අපට පැවරී ඇති වගකීම් රැසකි.

(ඇ) ලෝක ජනගහනය වර්ධනය වුව ද ඊට ප්‍රමාණවත් ලෙස ස්වාභාවික අහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු නොවන බව පැහැදිලි කරුණකි. මේ නිසා කෘත්‍රිම ආහාර භාවිතය කෙරෙහි යොමු වීමට සිදු වී ඇති බව පෙනේ. මේ නිසා ඇති වන ගැටලු කොහෝ ය. මෝ නොවන රෝග ව්‍යාප්තිය එක් නිදසුනකි. මිනිස් ජීවිත එයින් මුදවා ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඒ) තාක්ෂණ දියුණුව වර්තමානය වන විට සෑම ක්ෂේත්‍රයක් කරා ම ව්‍යාප්ත වෙමින් පවතී. ලෝක සංවර්ධනයට අනුගත වෙමින් ඉදිරියට යෑම සඳහා මෙම තාක්ෂණික පබැඳියාව ප්‍රබල පිටිවහලක් සපයයි. අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා තාක්ෂණයෙන් ලද හැකි ප්‍රයෝජන අසීමිත ය. තාක්ෂණය නිවැරදි ව අධ්‍යාපන කටයුතු සඳහා භාවිත කරමින් ලෝකය ජය ගැනීම අපේ අභිමතාර්ථය විය යුතු ය.

(ලකුණු 25 යි)

[දහවැනි පිටුව බලන්න.

3. පහත දැක්වෙන පාඨය වචන 55- 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

නිර්මාණාත්මක සන්නිවේදනය යනු කිසියම් සන්දේශයක් කිසියම් මාධ්‍යයක් ඔස්සේ වඩාත් අපූර්වත්වයකින් යුතුව ඉදිරිපත් කිරීම යි. ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත යන සන්නිවේදන ක්‍රමයන්ගේ වර්ධනයත් සමග ජනමාධ්‍ය භාවිතය පිළිබඳ ව යම් යම් විධික්‍රමයන් ද ඇති වූ බව මානව ඉතිහාසය තුළින් පැහැදිලි වේ. එහි දී ඒවා අපූර්වත්වයකින් යුතුව ඉදිරිපත් කිරීමත්, ග්‍රාහකයාගේ අවධානයට හසුකිරීමත් මූලික අපේක්ෂාව විය. නිර්මාණශීලී ගුණය සඳහා යහපත් ප්‍රතිචාර ලබා ගැනීම හා සාර්ථක ව යම් අර්ථ සිද්ධියක් ළඟා කර ගැනීම අපේක්ෂාව වේ. සමහරු එය සමාජීය අවශ්‍යතාවක් මුදුන් පත් කර ගැනීමක් ලෙසට ද හඳුන්වති. එසේ ම එමගින් අන්‍යයන්ට යමක් වටහා ගැනීමේ හැකියාව ද ඇති වී තිබේ.

නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වඩාත් වැදගත් වන්නේ ජන කණ්ඩායම් අතර පවතින ජන නිර්මාණ අධ්‍යයනයට හසු කර ගැනීම යි. මෙවා ජනශ්‍රැති පනුවෙන් හඳුන්වන අතර එම ජනශ්‍රැතිවලට අයත් වන්නේ ජනකතා, ජනකවි, ජනක්‍රීඩා, ජනඇදහිලි, ජනආගම්, සිරිත්විරිත් යනාදි අංගයන් ය. ජනශ්‍රැති අංග මානව සමාජය තුළ ජනතාවගේ උන්නතිය සඳහා උපකාර වන්නා සේ ම සමාජ යථාර්ථය නිර්මාණාත්මකව හඳුන්වා දීමට ද උපකාරී වේ. මානව විද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ ජනශ්‍රැති අංගෝපාංගයන්ගෙන් තොර නිර්මාණාත්මක සන්නිවේදනයක් දැක ගත නොහැකි බව යි. මානව විද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ ජනශ්‍රැති අංගෝපාංගයන්ගෙන් තොර නිර්මාණාත්මක සන්නිවේදනයක් දැක ගත නොහැකි බවයි.

(ලකුණු 10 යි)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ප්‍රථම භාෂාව යනු දරුවා කුඩා කාලයේ දී එනම් ඇතැම් විට අවුරුදු 3 ½ පමණ වන විට එක ම භාෂාවක් කතා කරන මව්පියන්ගෙන් හෝ වැඩිහිටි සහෝදර සහෝදරියන් හා වෙනත් අයගේ හෝ කතාවලට ඇහුම්කන් දීමෙන් ග්‍රහණය කරනු ලබන භාෂාව ය. මෙහි එක් මූලික අවශ්‍යතාවක් වන්නේ අදාළ වැඩිහිටි සමාජය එක භාෂාවක් කතා කරන සමාජයක් වීම ය.

සාමාන්‍ය මානවයකුට භාෂාවක් ග්‍රහණය කිරීමට අභ්‍යන්තර ශක්තියක් තිබේ. ඒ හේතු කොට ගෙන යම් භාෂාවක් කතා කරන ආකාරය, එය පරිහරණය කරන ආකාරය අසන්නට හා දකින්නට අවස්ථාවක් ලබන එනම් භාෂාවකට අනාවෘත වන දරුවා අදාළ භාෂාව මනා සේ පරිහරණය කිරීමට සමත් වෙයි. මෙම මුළු මහත් ක්‍රියාවලිය භාෂා ප්‍රවිකරණය නම් වේ. එකම භාෂාවක් කතා කරන සමාජයක භාෂාව භාවිත කිරීමේ දී මෙය සිදුවන අතර භාෂාව ග්‍රහණය කරන්නා එය කරන්නේ අනායාසයෙන් ය. විධිමත් ඉගැන්වීමක් එහි නැත. භාෂාව ග්‍රහණය කරන්නා වූ අයට ඇසෙන්නේ ශබ්ද පමණකි. භාෂාවක් ග්‍රහණය කිරීමේ අභ්‍යන්තර ශක්තිය ඔවුන් සතුව තිබෙන බැවින් එම ශබ්ද යෙදෙන ආකාරය විශ්ලේෂණය කොට ක්‍රමවත් පද්ධතියක් මනස තුළ ඔවුහු වර්ධනය කර ගනිති.

ඉන් පසු ක්‍රමයෙන් වැඩි වයසට පත් වන ස්වභාෂකයාට එම භාෂාව කතා කරන කවර අයෙකු වුවත් ඒ හා සම්බන්ධ අර්ථ වටහා ගැනීමටත් අභිනවයෙන් වාක්‍ය නිපදවීමටත් අවශ්‍ය ශක්තිය අනායාසයෙන්ම ලැබේ. එබැවින් ඔහු පරමාදර්ශී භාෂකයෙකි,ශ්‍රාවකයෙකි. ඔහුගේ මනස ක්‍රමලේඛගත කොට ඇත. මෙය භාෂා දැනීම පිළිබඳ ඉතා විස්මයජනක සිද්ධියකි.

[එකොළොප් වැනි පිටුව බලන්න.

(i) දරුවකු ප්‍රථම භාෂාවක් ග්‍රහණය කර ගන්නේ කෙසේ ද?
(ii) දරුවකු භාෂාවක් මැනවින් ග්‍රහණය කර ගන්නා ක්‍රියාදාමය මෙහි හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(iii) භාෂාවක් ග්‍රහණය කර ගැනීමෙහි ලා ආභ්‍යන්තරික ශක්තිය වැදගත් වන්නේ ඇයි?
(iv) ක්‍රමයෙන් වැඩිවයසට පත් වන ස්වභාෂකයාට අනායාසයෙන් ම ලැබෙන භාෂා හැකියා මොනවා ද?
(v) පහත සඳහන් පදවලට සමානාර්ථය දෙන පද ඡේදයෙන් පොයා ලියන්න.

- නිරුත්සාහය :.....
- අසන්නා :.....

(ලකුණු 10 යි)

5. පහත දී ඇති විස්තරය පදනම් කොට ගෙන න්‍යාය පත්‍රයක් සකස් කරන්න (වචන 100 පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.)

ඉඳුනිල්ගම සදානන්ද විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග හා සහනික ප්‍රදානෝත්සවය ඉදිරි දිනෙක පැවැත්වීමට නියමිත ය. එහි දී ගායන, නර්තන අංග මෙන් ම සාහිත්‍ය දේශනයක් ද පැවැත්වීමට කටයුතු යොදා ඇත.

නැළඟහෙක්

නෙලුම්දෙණිය මහා විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ ලේකම් ඔබ යැයි සිතා සාහිත්‍ය සංගමයට අවශ්‍ය පොත් මිල දී ගැනීම සඳහා මිල ගණන් සහිත ග්‍රන්ථ නාමාවලියක් ලබා දෙන ලෙස ඉල්ලමින් නැණ පහන පොත් ප්‍රකාශන ආයතනයේ කළමනාකරු වෙත යැවීමට සුදුසු **ව්‍යාපාරික ලිපිය** සකස් කරන්න.
(මේ සඳහා වචන 100 ක් පමණ යෑගේ)

(ලකුණු 15 යි)

***

සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
*** 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80කි.**

1. (I) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට මඟ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) උග්ගසේන නම් සිටුපුත්‍රයාගේ වස්තුව ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) එම ග්‍රන්ථය රචනා වූ සාහිත්‍ය යුගය නම් කරන්න.

(ii) හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
උෆරෝ ඇවිත් වට පිට කරති සක්මන්

(අ) ඉහත උද්ධෘත කාව්‍ය කෘතිය අයත්වන ජනකවි ප්‍රවර්ගය කුමක් ද?
(ආ) දැනගැනුමකට කී කවි හැඳින්වීමට යෙදෙන නවත් නමක් ලියන්න.

(iii) (අ) මහාචාර්ය එදිරිවීර සරන්චන්ද්‍ර මහතාගේ ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද?
(ආ) සිංහබාහු නාටකය අයත් වන නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න?

(iv) (අ) " ගංගාවේ සංගීතය " පද්‍ය පන්තිය ලියූ රචකයා හැඳින්වූ අන්වර්ථ නාමය කුමක් ද?
(ආ) එම රචකයා ආභාපය ලැබුවේ කුමන ඉන්දියානු කවියාගෙන් ද?

(v) (අ) පන්සිය පනස් ජාතක පොත සඳහා මූලාශ්‍රය කොට ගත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) පණ්ඩිතවරුන් දපදෙනාට එකොළොස් වැනි ව ඔද වුලනී රජුගේ පේනාවට අනුශාපනා කළේ කවුද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය ආරම්භ කරන්නේ කවර ගණයෙන් ද?
(ආ) වෙසෙස් රුවින් නම මැවුවත් බඹහට
පදැප පවන් නොකළැ යි වූ තොසකුට

මෙහි නොසකුටට පත් වූ වෝ කවරහු ද?

(vii) රජ නොයෙක් වරැ " ඔහු ඇතැණියෙන් තිරු කොටැ ගත්තේ යැ " යි ඇතුන් දී යවී යැ.
(අ) මෙම පාඨයේ ඔහු යනුවෙන් හඳුන්වා දැන්නේ කවරෙක් ද?
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් ග්‍රන්ථය රචනා වී ඇත්තේ බුදුරදුන්ගේ කුමන ගුණයක් පදනම් කරගෙන ද?

(viii) පහත පදඛන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ග නේ මිණි බැබැළි තිරඟෙවි පතපාය
(අ) .....
(ආ) .....
පෙනේ දකුණු මහසෙන් දෙවි රද පාය

(ix) (අ) 'බැද්දේගම' නමින් පරිවර්තිත නව කතාවේ කතුවරයා නම් කරන්න.
(ආ) ලෙනාඩ වුල්ෆ් මහතා දකුණු පළාතේ රාජකාරි ඉටු කළේ කුමන තනතුරකින් ද?

(x) (අ) ටිබෙට් ජාතික එස්.මහින්ද හිමිගේ මුල් ම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.
(ආ) චිත්‍රපටයකට නැඟුණු මහගම සේකරගේ නවකතාව කුමක් ද?

(ලකුණු 02×10 = 20 යි)

2. පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ තියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න .

(i) **කනක රජතාදීන්** විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නා නා වස්තුයෙන් **සමුජ්වලිත** රත්නාදියෙහි නඟන ලද නා නා ප්‍රකාර ධවලච්ඡත්‍ර පංක්තියෙන් ගැවැසී ගත්තී ය.

(අ) මෙහි සඳහන් වන්නේ කවර අවස්ථාවක් පිළිබඳ ව ද?
(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ii) මිහ'ඔ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉපුරු පිරී සැදි ඒ වෙහෙර සිට
කිරණි පොකුරු මී රප ලැබ බොන ලෙසට
නරණ මිතුර තගෙ නෙතක සිත සතුටු තොට

(අ) මේ තවියෙහි මහී කාන්තාවගේ මුව මඬල සමාන කොට දක්වන්නේ කුමකට ද?
(ආ) 'මිතුර' යනුවෙන් ඇමතුම් ලබන්නේ කවරෙක් ද?

(iii)"දෙව්මිනිසුන් විසින් පුදන ලද බුදුරජ බොහෝ කලක් ගිය කලැ මට වැඩ සඳහා මෙ මහ වලට වැඩි යැ".
(අ) මෙම ප්‍රකාශය කා විසින් කරන ලද්දක් ද?
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න

(iv)'දවස් ගානක් හිස්පෙ මං මෙහාට ආවේ මේක දැන ගත්ඩ. මට තවත් කරදර කරන්ව මා එළවන්නේ ඇයි?'

(අ) මේ කවරකු අමතා කරන ප්‍රකාශයක් ද?
(ආ) මෙපේ පැමිණ ඇත්තේ කවර තරුණත් දැන ගැනීම පදහා ද?

(i) නොතරන් එලෙපා පියතුමගේ අණ
ඉක්මවලා පුතුනේ
නපුරුයි වත්තේ අප සැම දෙනටා
නොකළොත් කී ලෙසිනා

(අ) මේ ප්‍රකාශයේ "පුතුනේ " යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?
(ආ) හැම දෙනාට නපුරක් ගෙන දීමට හේතු වන කරුණ සඳහන් කරන්න.

(ලකුණු 04×05 -20 යි)

3. උග්ගසේන නම් සිටුපුත්තුගේ වස්තුව මගින් දක්වෙන්නේ

(I) මුල දී අත් දකීම් අඩුකම හේතුවෙන් හැඟීම්වලට වහල් වුව ද
(II) පසුව අත් දකීම් මුහුකුරා යෑමෙන් සාර්ථක ව අභියෝග ජයගත් තරුණයෙකු පිළිබඳ රසවත් කතා පුවතකි. නිර්දිෂ්ට පාඨම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

පැළලිහිණි සන්දේශයෙහි ඇතුළත් මාර්ග වර්ණනා රසවත් වීමෙහි ලා

(I) ශබ්ද රසය ඉස්මතු වන පරිදි භාෂාව යොදා ගැනීමටත්
(II) ස්වභාවෝක්ති වර්ණනාත් හේතු වෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

4. 'බැද්දේගම' නවකතාවෙන් ගැමියන් පිරිසක්

(I) ස්වභාව ධර්මයේ පීඩාවට ද
(II) නීතියේ අසාධාරණයට ද

ගොදුරු වන ආකාරය මනාව නිරූපිත ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

'ගංගාවේ පංගීතය' කවි පෙළේ සාර්ථකත්වය සඳහා කවියා යොදා ගෙන ඇති

(i) කව්‍යෝචිත භාෂාවත්
(ii) නිරූපිත ජීවන යථාර්ථයත්

හේතු වන අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

5. අතීත ශ්‍රී විභූතිය මස්සේ පමෘද්ධිමත් හෙට දිනයක් පිළිබඳ අපේක්ෂා දල්වන නිර්මාණයක් ලෙස 'දෑතේ කරගැට සිඹ සතසන්නට' කවි පෙළ අගය කළ හැකි ය. උදාහරණ කුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

6. වඩා යහපත් සෞඛ්‍ය සුරුදු ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා නිලධාරීන් දරන්නා වූ ප්‍රයත්නය පිළිබඳ ගැමියන්ගේ ආකල්ප ඉදිරිපත් කිරීමට භාෂ්‍යය හා උපහාසය දනවන පරිදි මැනවින් ඉදිරිපත් කිරීමට 'අපට වැපිතිළියක් ' කෙටි කතාවේ රචකයා සමත් වෙයි. උදාහරණ කුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10යි)

7. රසික සිත් ප්‍රබෝධවත් වන පරිදි අවස්ථා නිරූපණය කිරීමෙහි ලා වැත්තෑවේ හිමියන් සතු ප්‍රතිභාව සුරඟන රැඟුම් පිළිබඳ තෙරෙන විර්ණනාව මඟින් මනා ව ප්‍රකට වෙයි. උදාහරණ කුනක්වත් දක්වමින් පහදන්න.

(ලකුණු 10 යි)

***